# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 610 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 08/04/2024<br>පැය 1745 |

## මාධ්‍ය නිවේදනය

**පොලිසිය සමඟ ඇති වූ වෙඩි හුවමාරුවකින් සැකකරුවෙකු මියයාම – පාදුක්ක පොලිස් වසම.**

2024.04.07 වන දින මොරගහහේන පොලිස් වසමේ මාලොස්ඇල ප්‍රදේශයේදී ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටි පුද්ගලයන් දෙදෙනෙකුට වෙඩි තබා ඝාතනය කිරීමේ අපරාධයේ වෙඩික්කරු බවට සැකකරන පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම සඳහා එදින රාත්‍රී කාලයේ පාදුක්ක පොලිස් වසමේ සැකකරු පදිංචි නිවසට පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් හා බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ගොස් තිබුණි.

එම අවස්ථාවේ සැකකරු නිවසේ නොසිටීම හේතුවෙන් සැකකරු නිවසට පැමිණේ යැයි සැකය මත අංගමුව ප්‍රදේශයේ සැකකරුගේ නිවසට ආසන්නව ක්ෂණික මාර්ග බාධකයක් යොදා තිබියදී 2024.04.08 වන අද දින අළුයම් කාලයේ මාර්ග බාධකය ආසන්නයට පැමිණි සැකකටයුතු යතුරුපැදියක් එහි පහන් ආලෝකයෙන් පොලිස් නිලධාරීන් දැකීමෙන් පසු යතුරු පැදිකරු යතුරුපැදිය අතහැර දමා පැන යාමට කටයුතු කර ඇති අතර එම පැනයන අවස්ථාවේදී නිලධාරීන් ඔහු පසුපස හඹා ඒම වැලැක්වීම සඳහා ඔහු අත තිබූ ගිනි අවියකින් නිලධාරීන් දෙසට වෙඩි තැබීමක් සිදු කර ඇත.

එහිදී, නිලධාරීන් විසින් එල්ලකරන ලද ප්‍රතිප්‍රහාර වලින් සැකකරු තුවාල ලබා පාදුක්ක රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වන මීරියගල්ල, පාදුක්ක ප්‍රදේශයේ පදිංචි ගුවන් හමුදා කෝප්‍රල්වරයෙකි.**

පාදුක්ක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**